1. මූල්‍ය ප්‍රකාශන

1.1 ව්‍යාවනය කළ මතය

සීමා සහිත මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමේ 2021මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම

කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 57 වන ඡේදය ප්‍රකාරව 2021 මාර්තු 31 දිනට පැවති රු.8,680,365ක් වූ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සඳහා ආයු ගණක තක්සේරුව කර නොතිබූ බැවින් නිවැරදිතාවය තහවුරු නොවිය.	එය ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර නිවැරදි කිරීමට කටයුතු කරමි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් වගකීම ගණනය කිරීම කළ යුතු වේ.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24හි 26 (අ) වන ඡේදය ප්‍රකාරව සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධනය මණ්ඩලයෙහි ආශ්‍රිත සමාගමක් වුවද මණ්ඩලය සමඟ සිදු වී ඇති ගනුදෙනු සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.	මෙම හෙළිදරව් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් ඉදිරි ගිණුම් වර්ෂවලදී නිවැරදි කිරීමට කටයුතු කරමි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 ප්‍රකාරව අදාළ ආයතනය ආශ්‍රිත සමාගමක් වන විට ඒ සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සිදු කළ යුතු වේ.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41හි 04 වන ඡේදය ප්‍රකාරව රු.1,839,935 ක් වටිනා ඌරන්ගේ වටිනාකම 2021 මාර්තු 31 දිනට ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කළ යුතු වුවද එම වටිනාකම තොග ශේෂය යටතේ දක්වා තිබුණි.	එය ඉදිරියේ නිවැරදි කිරීමට කටයුතු කරමි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41 ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ.
(ඈ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 හි 5.5.15 ඡේදය ප්‍රකාරව වෙළඳ ලැබිය යුතු දෑ ගනණය කිරීමේදි පසුකාලීන මැනීම සඳහා අපේක්ෂිත ණය අලාභ ක්‍රමය (Expected Credit Loss Method) භාවිතා කල යුතු වුවත් සමාගම විසින් 2021 මාර්තු 31 දිනට සමාගමේ වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය වූ රු.3,262,651 හි වටිනාකම ඒ අනුව කටයුතු කර ගණනය කර නොතිබීම හේතුවෙන් අදාළ වටිනාකමෙහි නිරවද්‍යතාව විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.	එම ක්‍රමවේදය ඉදිරියේ දී අනුගමනය කිරීමට කටයුතු කරමි.	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 ප්‍රකාරව පසුකාලීන මැනීම සඳහා අපේක්ෂිත ණය අලාභ ක්‍රමය අනුව වෙන්කිරීම් කළ යුතු වේ.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව දේපල පිරියත හා උපකරණවල මුළු පිරිවැය රු.116,006,884ක් වුවද එදිනට ලෙජරය අනුව ශේෂය රු.116,558,114 ක් වූයෙන් රු.551,230 ක වෙනසක් විය.	සාදා අවසන් වූ ගොඩනැගිල්ලේ වටිනාකම එයට අළුතින් එකතු කිරීම මෙම වටිනාකම වැඩි වීමට හේතු වී ඇත.	වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.
(ආ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපීම් යටතේ ආයෝජන මත පොළී ආදායම රු.1,740,674 ක් පමණක් ගැලපිය යුතු වුවද සමාගම විසින් රු.3,376,341 ක් ගැලපීම් කර තිබුණි.	එය නිවැරදි කිරීමට කටයුතු කරමි.	නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ.
(ඇ)	මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර තැන්පතු ශේෂය රු.19,844,721 ක් වුවද ස්ථාවර තැන්පතු අලුත් කිරීමේ නිවේදන අනුව ගණනය කරන ලද තැන්පතු ශේෂය රු.20,004,566 ක් වූයෙන් රු159,845ක වෙනසක් පැවතුණි.	ස්ථාවර තැන්පතු ශේෂය ගණනය කරන ලද්දේ ස්ථාවර තැන්පතුව කල් පිරෙන දිනට වේ.	ස්ථාවර තැන්පතු වටිනාකම ශේෂ පත්‍ර දිනට ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ.
(ඈ)	මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.366,008 ක්වූ සත්ත්ව හා වෙනත් ආහාර ද, රු.19,026,022ක් වූ අභිජනන සතුන් 13,960කින් සතුන් 6566ක් ද සත්‍යාපනය කර නොතිබූ අතර රු.3,484,254ක් වූ බිත්තර තොග සඳහා සත්‍යාපන වාර්තාද විගණනයට ඉදිරිපත් නොවූයෙන් එම තොග වල පැවැත්ම හා නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.	එම ගිණුම් ගිණුම්ගත කිරීමේදී එක් එක් කාණ්ඩයට අනුකූලව වෙන වෙනම ගිණුම් ගත කර ඇත. එම ගිණුම්වල නිවැරදිතාව 100% ක් වේ.	තොග සත්‍යාපන වාර්තා අනුව ශේෂයේ නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය. භෞතික තොග සත්‍යාපනය නිවැරදිව සිදු කිරීමට කටයුතු කළ යුතු වේ.
(ඉ)	2021 මාර්තු 31 දිනට වෙනත් ලැබිය යුතු දැහි වටිනාකම රු.64,592,694 ක් වූ අතර ඉන් රු.64,316,040 ක් වර්ෂ ගණනක සිට පැවත එන ශේෂයන් විය. 2021 මාර්තු 31 දින වන විටත් එම ශේෂ අයකරගෙන නොතිබුණු අතර එම ශේෂයන්ට අදාළ ලිඛිතමය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූයෙන් අදාල ශේෂවල නිරවද්‍යතාව විගණනයේදී තහවුරු කරගැනීමට නොහැකි විය. තවද මෙම ශේෂ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි අඩමාණ ණය සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් කර නොතිබුණි.	එය ඉදිරියේ නිවැරදි කිරීමට කටයුතු කරමි.	හිග ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. තවද වෙළද ගෙවියයුතු දැ වල කාල විශ්ලේෂණයක්, ගනුදෙනුවල ස්වභාවය යන තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතු වේ.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සාමාන්‍ය තොග වටිනාකම	5,130,506	4,149,177	981,329	එම වෙනස පෙර ගිණුම් වර්ෂවල සිට දිගින් දිගටම පැවත එන ශේෂයක් වන අතර එම වෙනසට හේතු සොයාගත නොහැක. අධ්‍යක්ෂ මණ්ඩලයට යොමුකර එහිදී ගන්නා තීරණ වලට අනුව කටයුතු කරමි.	වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ.
(ආ)	මිශ්‍ර ආහාර තොගය	124,946	218,761	93,815	එම මිශ්‍ර ආහාර තොගයන්ද දිගින් දිගටම අප ගිණුම්වල පැවත එන අගයන් වේ. අධ්‍යක්ෂ මණ්ඩලයට යොමුකර එහිදී ගන්නා තීරණ වලට අනුව කටයුතු කරමි.	වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ.

1.5.4 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2007 අංක 07 දරන සමාගම් පනතේ 220 ඡේදය ප්‍රකාරව සමාගමක ශුද්ධ වත්කම් එම සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකට වඩා අඩු බව පෙනී යන විටදී සමාගමට දැරීමට සිදුවී ඇති පාඩුවල ස්වභාවය හා ප්‍රමාණය, දැරීමට සිදුව ඇති පාඩුවට හේතුව හෝ හේතු, එවැනි පාඩු තවදුරටත් ඇතිවීම වැළැක්වීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පියවර කිසිවක් ගෙන ඇත්නම් ඒ පිළිබඳ කොටස් හිමියන්ට දැනුම් දෙමින් වාර්තාවක් පිළියෙල කර එම වාර්තාව සමඟ සමාගමේ කොටස්හිමියන්ගේ අති විශේෂ මහ සභා රැස්වීමක් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් කැඳවිය යුතුය. එසේ වුවද 2021 මාර්තු 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.22,965,030 ක් හා ශුද්ධ වත්කම්වල අගය සෘණ රු.24,707,845ක් වී තිබුණද සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025 මැයි 20 දින වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණ අතර ඒ අනුව සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පවතින බව ද නිරීක්ෂණය විය.	අදහස් දක්වා නොමැත.	සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පවතින බැවින් ඊට අදාල විධිමත් ක්‍රියාමාර්ග ගැනීමටත් 2007 අංක 7 දරන සමාගම් පනතේ 220 ඡේදය ප්‍රකාරව අති විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමටත් කටයුතු කළ යුතු වේ.

1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගෙවිය යුතු ආදායම් බදු	27,021,012	උපලේඛන හා බදු වාර්තා	එම ශේෂයන්ට අදාල තොරතුරු අප ආයතනය සතුව නොමැත.	ශේෂ හදුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.
(ආ)	එකතු කල අගය මත බදු	25,607	උපලේඛන හා බදු වාර්තා	එම ශේෂයන්ට අදාල තොරතුරු අප ආයතනය සතුව නොමැත.	ශේෂ හදුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.
(ඇ)	ආර්ථික සේවා ගාස්තු	158,676	උපලේඛන හා බදු වාර්තා	එම ශේෂයන්ට අදාල තොරතුරු අප ආයතනය සතුව නොමැත.	ශේෂ හදුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.
(ඈ)	අඩමාණ ණය වෙන් කිරීම්	10,630,937	ගණනය කිරීමේ උපලේඛන	එම අඩමාන ණය වෙන් කිරීම දිගින් දිගටම පැමිණ එන ශේෂයක් වන අතර කුමන ණය ගැතියන්ට මෙම ණය ශේෂය වෙන් කර ඇතිද යන වග අප සමාගම සතුව කිසිදු ලියකියවිල්ලක් නොමැත.	ගණනය කිරීමට අදාල තොරතුරු විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වේ.
(ඉ)	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ගෙවිය යුතු	995,230	ශේෂ සනාථන	එම ශේෂයද දිගින් දිගටම පැමිණෙන ශේෂයක් වන අතර එම ශේෂයද අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ලාභ අලාභ ගිණුමට ගැලපීමට කටයුතු කරමි.	ගිණුම් ශේෂ තහවුරු කර ගැනීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතු වේ.
(ඊ)	මහජන බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමේ	49,389	බැංකු සනාථන ඉතුරුම් ගිණුම් පොත	මෙම ගිණුම සම්බන්ධයෙන් අදාල තොරතුරු ඉල්ලා ලිපියක් එම බැංකුව වෙත යොමු කරන ලදි. මේ වන තෙක් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් නොමැත.	ශේෂ සනාත කර ගැනීමට කටයුතු කළ යුතු වේ.
(උ)	විභජනය නොකරන ලද කොටස් වෙනුවෙන් ලද මුදල	133,589	කොටස් සහතික කොටස් නිකුත් කිරීමට අදාල විස්තර	මෙම ශේෂයන් වසර 10 කට පෙර සිට පැවත එන ශේෂයන් වන අතර එම ශේෂයන් පිළිබද අප සමාගම සතුව තොරතුරු නොමැත	කොටස් සහතික සහ කොටස් නිකුත් කිරීම පිළිබද විස්තර ඇතුලත් ගොනුවක් පවත්වාගෙන යා යුතු වේ.

(ඌ)	සංචිත	5,440,064	ප්‍රත්‍යාගණන වාර්තා ප්‍රත්‍යාගණනයට අදාල විස්තර	මෙම ශේෂයන් වසර 10 කට පෙර සිට පැවත එන ශේෂයන් වන අතර එම ශේෂයන් පිළිබද අප සමාගම සතුව තොරතුරු නොමැත	ප්‍රත්‍යාගණනයට අදාල තොරතුරු පවත්වාගෙන යාමට කටයුතු කල යුතු වේ.
(එ)	ගෙවිය යුතු සමුච්චිත වරණිය කොටස් ලාභාංශ	5,339,059	වරණිය කොටස් සහතික ලාභාංශ වෙන්කිරීමට අදාල තොරතුරු	මෙම ශේෂයන් වසර 10 කට පෙර සිට පැවත එන ශේෂයන් වන අතර එම ශේෂයන් පිළිබද අප සමාගම සතුව තොරතුරු නොමැත	ශේෂ හදුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.
(ඒ)	සුභ සාධක සංචිතය	950,265	සංචිත වෙන් කිරීමට අදාල ලේඛණ හා ගොනු	මෙම ශේෂයන් වසර 10 කට පෙර සිට පැවත එන ශේෂයන් වන අතර එම ශේෂයන් පිළිබද අප සමාගම සතුව තොරතුරු නොමැත	සංචිත වෙන්කිරීම් වලට අදාල විස්තර පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වේ.
(ඔ)	ගෙවිය යුතු ශේෂ	33,602,817	ශේෂ සනාතන, කාල විශ්ලේෂණ වාර්තා	මෙම ශේෂයන් දිගින් දිගටම පැවත එන ශේෂයන් වේ. එම ශේෂයන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර එහිදි ගන්නා තීරණවලට අනුකූලව කටයුතු කරමි.	හිග ශේෂ හදුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 මාර්තු 31 දිනට සමාගමේ වෙළඳ ගෙවිය යුතු දැ හි ශේෂය රු.24,513,492 ක් වූ අතර ඉන් රු.21,314,781 ක් දින 90 ඉක්ම වූ ශේෂ වන අතර එම ශේෂ නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, රු.20,858,087 ක් පුද්ගලික සමාගමක් වෙතින් සත්ත්ව ආහාර මිලදී ගැනීම වෙනුවෙන් ගෙවියයුතු 2018 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයක් විය.	මේ වන විට මේ ශේෂයන් පියවීමට කටයුතු කරමින් පවතී. මාසිකව මෙම ගෙවීමේ කටයුතු සිදු කරනු ලබයි.	ගෙවා අවසන් නොමැති ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2007 අංක 07 දරණ සමාගම් පනතේ 166 වගන්තිය	ගිණුම් වර්ෂය අවසාන වීමෙන් මාස 06 කට පසු සමාගමේ කටයුතු සම්බන්ධයෙන් එම වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව පිළියෙල කළ යුතු වුවද සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	අප සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර නොමැති වීම හේතුවෙන් නියමිත දිනට වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීමට අපහසුවී ඇත. ඉදිරියේදී මෙම ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.	පනතේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ.
(ආ)	2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක PED/12			
	i. 3.1 හා 3.2 වගන්තිය	සමාගමේ කටයුතු මෙහෙයවීම හා කළමනාකරණ සහ මෙහෙයුම් අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කළ යුතු වුවද සමාගමේ කාර්යයන් අධීක්ෂණය හා මෙහෙයවීම සඳහා 2019 වර්ෂයෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර නොතිබුණි.	2019 වර්ෂයේ අග සිට මේ වන තෙක් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර නොමැත. එබැවින් මේ දක්වා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්ද පවත්වා නොමැත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කළ යුතු වේ.
	ii. 5.1.3 වගන්තිය	මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට කලින් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මක් ඉදිරිපත් කළ යුතු වුවද 2020/21 වර්ෂ ආවරණය කරමින් සංයුක්ත සැලැස්මක් 2025 පෙබරවාරි 28 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමට 2019 වර්ෂයේ සිට මේ දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර නොමැති අතර පසුගිය වර්ෂ සඳහා සංයුක්ත සැලැස්මක් සකසා නොමැත. ඉදිරි වර්ෂ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්වීමෙන් පසු සංයුක්ත සැලැස්ම සකස් කිරීමට කටයුතු කරමි.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ.
	iii. 5.2.4 සහ 5.2.5 වගන්තිය	අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අයවැය අනුමත කර අදාළ මූල්‍ය වර්ෂය ආරම්භවීමට දින 15 කට නොඅඩු කාලයක් තුළ අදාල	2019 වර්ෂයේ අග සිට මේ වන තෙක් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර නොමැත. එබැවින් අය වැය	එක් ඒ වර්ෂයට අදාල අයවැය ලේඛණ නියමිත කාලය තුල ඉදිරිපත් කිරීමට

		අධිකාරීන් වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2020/2021 වර්ෂයේ අයවැය ලේඛනය අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2025 පෙබරවාරි 28 දක්වා අනුමත කර නොතිබුණි.	සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ඉදිරිපත් කිරීමටත් නොහැකිවී ඇත.	කටයුතු කළ යුතු වේ.
	iv. 6.5.1 වගන්තිය	ගිණුම් වර්ෂය අවසාන වී දින 60ක් තුළ වාර්ෂික ගිණුම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2020/2021 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණේ මාස 38ක ප්‍රමාදයක් සහිතව 2024 සැප්තැම්බර් 09 දින දීය.	අධ්‍යක්ෂ මණ්ඩලයක් නොමැති බැවින් ගිණුම් ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති අතර දැනට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුමැතියෙන් විගණනය සඳහා ඉදිරිපත් කරනු ලබයි.	ගිණුම් වාර්තා නියමිත කාලය තුල ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ.
(ඈ)	2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(II) වගන්තිය	සමාලෝචිත වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර නොමැති වීමෙන් අනුමැතියක් සහිතව ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ.
(ඇ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.2.1 වගන්තිය	සමාගම විසින් 2020 හා 2021 වර්ෂ සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.	සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමට 2019 වර්ෂයේ සිට මේ දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් නොමැති හෙයින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීම සහ අනුමත කිරීම යන කටයුතු සිදු කිරීමට අපොහොසත් වී ඇත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වේ.
(ඉ)	1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842	සමාගම විසින් ක්‍රමවත් පරිදි ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණු බැවින් වර්ෂය අවසාන දිනට සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති වත්කම් හදුනාගැනීමට නොහැකි විය.	අදහස් දක්වා නොතිබුණි	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,483,418ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අලාභය රු.29,177,604 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 32,661,022ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් ආදායම ඉහල යාම සහ විකුණුම් පිරිවැය සහ පරිපාලන සහ බෙදාහැරීමේ වියදම් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ සමාගමේ විකුණුම් ආදායම සියයට 14 කින් වර්ධනය වී පැවති අතර ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණේ ඉකුත් වර්ෂයට සාපේක්ෂව අභිජණන ව්‍යාපෘතියේ ආදායම සියයට 39 කින් ඉහල යාම වේ. කෙසේ වුවද බ්‍රොයිලර් ව්‍යාපෘතියේ සහ ඌරන් ඇතිකිරීමේ ව්‍යාපෘතියේ ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 4 ක් සහ 59 ක් ලෙස අඩු වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ගොවිපලේ වගා ආදායම සියයට 62 කින් වර්ධනය වී තිබුණු අතර අනෙකුත් ආදායම් සියයට 100 කින් අඩුවී තිබුණි.

සමාලොචිත වර්ෂයේ විකුණුම් පිරිවැය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 10 කින් අඩුවී පැවති අතර ඊට සාපේක්ෂව ආයතන හා පරිපාලන වියදම් සහ බෙදාහැරීමේ වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 11 සහ සියයට 18 ලෙස අඩුවී තිබුණි. මේ හේතුවෙන් ආයතනයේ ශුද්ධ ලාභය සියයට 112 කින් වර්ධනය වී පැවති බව නිරීක්ෂණය විය.

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය, ක්ෂණික වත්කම් අනුපාතය, දළ ලාභ අනුපාතය, ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් 0.83 ක් 0.58ක්, සියයට 15.5, සහ 2.42 වු අතර පෙර වර්ෂයේ එම අනුපාතයන් පිළිවෙලින් 0.77ක් 0.55ක්, සෘණ සියයට 7ක් සහ සෘණ 23.11 ක් විය. ඒ අනුව මෙම අනුපාතයන් හි වර්ධනයක් නිරීක්ෂණය විය. ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතයන්ගේ වර්ධනයක් පෙන්නුම් කළද එම අනුපාතයන් ප්‍රශස්ත මට්ටමට පැමිණ නැති හෙයින් කාරක ප්‍රාග්ධන ගැටලුවකට මුහුණ පා ඇති බව නිරීක්ෂණය විය. තවද සමාගමේ තෝලන අනුපාතය එනම් මුළු වත්කම් සහ මුළු වගකීම් සැලකීමේදී මුළු වත්කම් ඉක්මවා වගකීම් පැවති බව නිරීක්ෂණය විය ඉකුත් වර්ෂයේ සහ සමාලොචිත වර්ෂයේ ඒම අගයන් පිළිවෙලින් 1.18 ක් සහ 1.21 ක් විය. ඒ අනුව සමාගම දිගුකාලීනව වගකීම් පියවා ගැනීමට නොහැකි වීම මත දිගුකාලීන බුන්වත්භාවයක් සිදු විය හැකි බව නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම විසින් පරිහරණය කරනු ලබන මහවැලි අධිකාරියට අයිති හුරුගස්වැව ගොවිපොළ ඉඩම සමාගම වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඒ සඳහා බදු ගිවිසුමක් ද නොතිබුණි. මෙම ඉඩමේ භූමි ප්‍රමාණය කොපමණද යන්න නිශ්චිතව හඳුනාගෙන නොතිබූ අතර නිෂ්කාර්යව පවතින භූමි ප්‍රමාණය ද නිශ්චිතව හඳුනාගත නොහැකි වී තිබුණි.	සමාගමේ සත්ත්ව ආහාර සැකසීම සඳහා මහවැලි අධිකාරියෙන් හුරිගස්වැව ගම්මානයේ පිහිටි මහවැලි ගබඩා සංකීර්ණ ගොඩනැගිලි දෙකක් ලබා දී තිබුණි. මෙය බද්දට හෝ පැවරීමක් සිදු කල කටයුත්තක් නොව මෙම ආයතනයත් මහවැලි අධිකාරිය යටතේ පාලනය වීමෙන් සිදුවූ ප්‍රතිඵලයකි.	වත්කම් විධිමත්ව පවරා ගැනීමට සහ ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ.
(ආ)	අනුරාධපුර තඹුත්තේගම අක්කර 26කින් යුතු මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමේ කාර්යාලය පිහිටි ගොවිපොළ ඉඩම මහවැලි අධිකාරියට අයත් වන අතර එම ඉඩම සම්බන්ධයෙන් 1989 ඔක්තෝබර් 03 දින තිස් අවුරුදු බදු ගිවිසුමකට එළඹ තිබුණි. එහි	සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම 30 අවුරුදු බදු පදනම මත පවත්වාගෙන ගිය අතර 2019 සැප්තැම්බර් මස 12 වන දින වන විට මෙම 30 අවුරුදු බදු කාලය අවසන් වී ඇත. වර්තමානය වන	නව ගිවිසුමකට එළඹීම හෝ විධිමත්ව පවරා ගැනීමට අදාල කටයුතු සිදු කළ යුතු වේ.

	කොන්දේසි අනුව 2019 වර්ෂයේ ඔක්තෝබර් 02 දින බදු කාල සීමාව අවසන් වී තිබුණි. තවද, එකතුව වර්ග අඩි 31,099 ක ගොඩනැගිලි හා වර්ග අඩි 46,924 ක ව්‍යුහයන්ගේ වටිනාකමක් ඇති ඉදිකිරීම් සිදුකර ඇති මෙම ඉඩමට අදාළ ගිවිසුම් යාවත්කාලීන කිරීමට ක්‍රියා කර නොතිබුණි.	විට මෙම සමාගම පැවරීමේ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම අතර සාකච්ඡා සිදු වෙමින් පවතී.	
(ඇ)	2015 ජූලි 16 දිනැති අංක අමප/15/0940/631/018-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා බැඳි අංක BD/RDS/124/CM/07 දරන 2015 ජූලි 08 දිනැති ලිපියේ සඳහන් මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණය අනුව අදාළ නීතිමය පරිපාටි යටතේ සමාගමේ මෙහෙයුම් කාර්යක්ෂමතාව තහවුරු කිරීම් සඳහා සියලු සම්පත්, වත්කම්, කොටස් සහ කළමණාකාරීත්වය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ලබාගත යුතු අතර 2017 වර්ෂය තුළ සමාගමේ කොටස් අයිතියෙන් සීයයට 27ක් පමණක් මණ්ඩලය සතුව තිබුණි. කෙසේ වුව ද මේ දක්වා අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අත්පත් කර ගැනීමේ කටයුතු නිම කර නොතිබුණි.	සමාගමේ කොටස් හිමිකාරීත්වයෙන් 27% ක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුවේ. මෙම පවරා ගැනීමේ කටයුතු ස්වාධීනව අප සමාගමට තනිව කල නොහැකි බැවින් මේ පිලිබඳ 2015 වර්ෂයේ සිට මේ දක්වා පැවරීමේ ක්‍රියාවලිය ක්‍රමවත්ව සිදු කිරිම සම්බන්ධයෙන් ඉල්ලීම් සිදුකර ඇත. සමාගම ඈවර කිරීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර මෙහි මහවැලි අධිකාරිය සතු කොටස් පවරාගැනීම පිලිබඳ දෙපාර්ශවයේ ඉහල කළමණාකාරීත්වය අතර සාකච්චා මට්ටමින් පවතී.	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතු වේ.